# සරත් ෆොන්සේකාගේ කොන්ත්‍රාත්තු හෙවත් පාවාදීම්

මේ ජනාධිපතිවරණය තවත් එක් ජනාධිපතිවරණයක් පමණක් නොවන බව අපි මුලදී ම කීවෙමු. අද වන විට ඒ ඉතා පැහැදිලිව ම පෙනෙන්නට පටන්ගෙන ඇත. මංගල ගොබෙල්ස්ගේ පච ප්‍රචාර මැද වුවත් ෆොන්සේකාට ජයගැනීමට කිසිදු ඉඩක් නොමැති බව මහින්ද රාජපක්ෂ මහතා වටා දිනපතා එක්රොක්වන ජනතාවගෙන් ප්‍රකාශ වෙයි. ගොබෙල්ස්ලාගේ අරමුණ වූයේ දැන් ජෙනරාල්ට වාසිය කියන පචය ජනතාව අතරට ගෙන ගොස් සරත් ෆොන්සේකා දිනන්නේ ය යන මතය ප්‍රචාරය කිරීම ය. එහෙත් එවැනි ප්‍රචාරවලින් මැතිවරණ ජයගත නොහැකි බව ගොබෙල්ස්ලාට අවබෝධ නොවිණි.

සරත් ෆොන්සේකාට විජාතික බලවේගවලින් කොන්ත්‍රාත්තු දෙකක් ලැබී ඇත. ඒ මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ මහත්වරුන් ඇතුළු කිහිප දෙනකු බටහිර යටත්විජිතවාදීන්ගේ දංගෙඩියට දැක්කීම එකකි. අනෙක අවුරුදු දෙකක් ඇතුළත නැවත ප්‍රභාකරන් කෙනකු බිහිකිරීම ය. පළමුවැන්න සඳහා සරත් ෆොන්සේකා රාජපක්ෂලාට හා සෙස්සන්ට විරුද්ධව ඊනියා සාක්ෂි එකතු කරයි. සුදු කොඩි කතාව එහි එක් අංගයක් පමණකි. බටහිරයන්ට අවශ්‍ය වන්නේ දෙමළ ත්‍රස්තවාදීන්ගේ ඊනියා මානව අයිතිවාසිකම් කැඩීමට එරෙහිව මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ පිරිස තම යුද්ධාධිකරණය ඉදිරියට පැමිණවීම ය. අද බටහිරයෝ ප්‍රභාකරන්ගේ ලේ වෙනුවෙන් මහින්ද රාජපක්ෂ මහතාගේ ලේ ඉල්ලති. ඒ මහතාගේ ගෙල දංගෙඩිය මතට පැමිණවීමේ කොන්ත්‍රාත්තුව භාර දී ඇත්තේ ජාතිද්‍රෝහී හා රාජද්‍රෝහී සරත් ෆොන්සේකාට ය. සුදු කොඩි කතා ගොතා කීමෙන් ඔහු ජාතිද්‍රෝහී පමණක් නොව රාජද්‍රෝහී ද වෙයි.

ෆොන්සේකාගේ දෙවැනි කොන්ත්‍රාත්තුව අවුරුදු දෙකක් ඇතුළත ප්‍රභාකරන් කෙනකු බිහිකිරීම ය. ඔහු හා සම්බන්ධන් අතර ඇති එකඟත්වය ඒ සඳහා ය. ඒ හුදු එකඟත්වයක් පමණක් නො වේ. ෆොන්සේකා හා සම්බන්ධන් ගිවිසුමක් අත්සන් කර ඇති අතර එයට සාක්ෂි වශයෙන් බටහිර රටවල් දෙකක තානාපතිවරු ද අත්සන් තබා ඇත. මේ ගිවිසුම පිළිබඳ ව දෙමළ එක්සත් සන්ධානයේ මන්ත්‍රීවරයකු වන තුරෙයිසිංහම් දැනටමත් ප්‍රකාශයක් කර ඇති අතර ගිවිසුම පිළිබඳ ව පිටරට වෙසෙන දෙමළ ජාතිවාදීන් දැනුම්වත් කර ඇති බව ටැමිල්නෙට් වෙබ් අඩවියෙන් පැහැදිලි වෙයි. ගිවිසුමෙන් ප්‍රධාන වශයෙන් ම කෙරෙන්නේ ඊනියා ස්වයංනිර්ණ අයිතිය, දෙමළ ජනයාගේ නිජභූමි සංකල්පය, උතුරු හා නැගෙනහිර පළාත් එකතුකිරීම (ජ වි පෙ විසින් ඒ එකතුවට විරුද්ධව පවරන ලද නඩුවේ තීන්දුව දුන් එක් විනිසුරුවකු වූ ද ජ වි පෙ විසින් අගමැති ධුරයට නම් කෙරී ඇති අනෙක් සරත් වූ ද සරත් සිල්වා ද ජ වි පෙ මෙන් ම අද වන විට උතුර හා නැගෙනහිර එතකුකිරීමට පක්ෂය. ජ වි පෙ එයට විරුද්ධ නම් සරත්ලාට දෙන සහාය වහාම අත්හිටුවිය යුතු ය. ඔවුහු එසේ නොකර ඒ සරත් හා මේ සරත් හැර රට පාවා දෙන තවත් සරත්ලා ඇත්දැයි සොයා බලති.) ත්‍රස්තවාදීන් කිසිම පරීක්ෂණයකින් තොරව නිදහස් කිරීම ආදිය නැවතත් දේශපාලනයේ පිළිගත හැකි සංකල්ප බවට පත්කිරීම ය. ඒ මගින් අපේ ජීවිත බිලිගන්නා දෙවැනි ප්‍රභාකරන් කෙනකු බිහිකිරීමට ය. ඒ දෙවැන්නාට ද බටහිරයන් සිංහලයන්ට විරුද්ධ ව ආයුධ ලබාදෙනු ඇත.

මේ සියල්ල අවබෝධ කරගත හැක්කේ බටහිර කසිකබල් උගතුන්ගේ පොතපත කියවා ඔවුන්ගේ ඇසින් ලෝකය බැලීමෙන් නො වේ. අපේ ඉතිහාසය අපේ ඇසින් බැලීමෙනි. පසුගිය දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ මේ සම්බන්ධයෙන් අප විසින් ගොඩනගා ගන්නා ලද දැනුම් සම්භාරයක් වෙයි. ඒ ඉතා සැකෙවින් මෙසේ ය. මෙරට දෙමළ ජනයාට ඈත අතීතයට යන ඉතිහාසයක් නැත. අද යාපනයේ වෙසෙන දෙමළ ජනයා 1650න් පසුව දුම්කොළ වගාව සඳහා ලන්දේසීන් කෝරමණ්ඩල වෙරළෙන් මෙරටට ගෙන්වන ලද දෙමළ ජනයාගෙන් හා එවකට එහි විසූ සිංහලයන්ගෙන් හා මලයාලම් කතාකළ වේලක්කාර පිරිසකගෙන් පැවත එන්නෝ වෙති. ලන්දේසීන් විසින් ගෙන්වන ලද්දෝ බහුතරය වෙල්ලාලයෝ වූහ. වෙල්ලාලයෝ කෘෂිකාර්මික කම්කරුවෝ වූහ. දකුණු අප්‍රිකාවේ නැටෝල් ප්‍රදේශයට ද ලන්දේසීන් විසින් වෙල්ලාලයෝ ගෙන යනු ලැබූහ. යාපන අර්ධද්වීපයේ බහුතරය යථාකාලයේ දී වෙල්ලාලයන් වීමේ ප්‍රතිඵලය වූයේ එහි ජනයා අවසානයේ දී වෙල්ලාල ආධිපත්‍යය යටතේ දෙමළ සංස්කෘතියට අවශෝෂණය කරනු ලැබීම ය.

© Prof. Nalin De Silva

ලන්දේසීන් විසින් සිංහල රජුට විරුද්ධව ඇතිකරනු ලැබූ දෙමළ ජාතිවාදය පළමුව ඔවුන් විසින් ද දෙවනුව බ්‍රිතාන්‍යයන් විසින් ද පෝෂණය කෙරිණි. සිංහල රජුට නැගෙනහිර වෙරළ අහිමිකිරීම සඳහා ලන්දේසීහු දෙමළ මුලාදෑනියකු ලවා යාල්පානම් වෛපව මාලෙයි ලියවූහ. බ්‍රිතාන්‍යයෝ ඉංගිරිසි උගත් දෙමළ ජනයාට දේශපාලනයේ ද අධ්‍යාපනයේ ද වෘත්තීන්හි ද වරප්‍රසාද දුන්හ. ව්‍යවස්ථාදායකයෙහි සිංහල මන්ත්‍රී සංඛ්‍යාව සිංහල නොවන මන්ත්‍රී සංඛ්‍යාවට වඩා අඩුවෙන් පවත්වාගෙන යමින් දෙමළ ජාතිවාදය දේශපාලන තලයට ගෙනාවෝ ය. බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය වූයේ ඔවුන්ගේ සුවච ගැති ඉංගිරිසි උගත් දෙමළ ජනයා, විශේෂයෙන් ම පොන්නම්බලම් කුමාරස්වාමි පවුල මුළු රටේ ම නායකත්වයට පත්කිරීම ය. සර්වජන ඡන්දයෙන් පසුව ව්‍යවස්ථාදායකයෙහි සිංහල මන්ත්‍රී සංඛ්‍යාව වැඩිවීමත් සමග බ්‍රිතාන්‍ය අරමුණ ඉටුකරගැනීම ප්‍රශ්නයක් විය. ඒ බව මුලින් ම දුටු චෙල්වනායගම් අඩුම තරමින් උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ට අහිමි කරමින් එහි වෙන දෙමළ රාජ්‍යයක් පිහිටුවීමට 1949 දී ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවීය. දෙමළ ජාතික සංධානය යනු මේ පක්ෂයෙහි විකාශයෙන් බිහිවූවකි.

චෙල්වනායගම්ගේ අරමුණ ඉටුකර ගැනීමට බටහිර උගත්තු විවිධ සංකල්ප නිර්මාණය කර දුන්හ. බ්‍රිතාන්‍යයන් ඉංගිරිසි උගත් දෙමළ ජනයාට දී තිබූ වරප්‍රසාද එක එක අඩුවීම දෙමළ ජනයාට කරන ලද අසාධාරණ ලෙස බටහිර ලෝකයෙහි හා ඉන්දියාවෙහි ප්‍රචාරය කෙරිණි. ස්වයංනිර්ණ අයිතිය, නිජභූමි සංකල්පය ආදිය මෙරට දේශපාලනයෙහි තහවුරු කෙරිණි. ඒ සඳහා කසිකබල් මාක්ස්වාදීන්ගේ ද මෙරට පුහු උගතුන්ගෙන් ද සහාය ලැබිණි. ඊනියා සිවිල් හෙවත් සිවල් ව්‍යාපාර රාජ්‍ය නොවන සංවිධාන ආදිය බටහිරයන්ගේ ආධාරයෙන් පිහිටුවන ලද්දේ සිංහලයන්ට විරුද්ධව දෙමළ ජාතිවාදය යොදාගැනීම සඳහා ය. චෙල්වනායගම් සාන්තුවරයෙක් නො වීය. උග්‍ර දෙමළ ජාතිවාදයකු වූ ඔහු දකුණු ඉන්දීය පල්ලියට යෑමට හා එහි සාමාජිකයකු වීමට ප්‍රිය කෙළේ ය. ප්‍රභාකරන් බිහිකරන ලද්දේ දෙමළ ජාතිවාදයේ විකාශයක් වූ චෙල්වනායගම්ගේ දේශපාලනයෙනි.

චෙල්වනායගම් වෙන ම රාජ්‍යයක් සඳහා  සටන ඇරඹුවා පමණක් නො වේ. ඉංගිරිසි උගත් දෙමළ ජනයාට පමණක් ඒ සටන කරගෙන යෑමට  බැරි බව ඔහු දුටුවේ ය. එබැවින් ඉංගිරිසි කතානොකරන දෙමළ ජනයාගේ ද මුස්ලිම් ජනයාගේ ද සහාය ලබාගැනීමට ඔහු කටයුතු කෙළේ ය. උතුරු පළාතේ පමණක් නොව නැගෙනහිර පළාතේ ද කඳුකරයේ ද ඔහු තම ව්‍යාපාරය ගෙනගියේ ය. එපමණක් නො වේ. ඔහු තම ඊනියා සාමකාමි සත්‍යග්‍රහ, සිංහල නාමපුවරු උඩ තාරගෑමේ ව්‍යාපෘති මගින් දෙමළ ජනයා, විශේෂයෙන් ම ඉංගිරිසි කතානොකරන දෙමළ ජනයා හිංසාවට යොමුකෙළේ ය. සාන්තුවරයකු ලෙස පෙනී සිටි මොහුගේ ව්‍යාපාරයේ අවසානය වූයේ ඉංගිරිසි කතාකරන දෙමළ ජනයාගේ වරප්‍රසාද නැතිවීම පිළිබඳ ප්‍රශ්නය ඉංගිරිසි කතානොකරන දෙමළ ජනයාගේ අවිගත් සටනක් බවට පත්කිරීම ය.

අවි හා පුහුණුව ලැබුණේ ඉන්දියාවෙන් හා බටහිර රටවලින් ය. ඉංගිරිසි උගත් දෙමළ ජනයාගේ වරප්‍රසාද වෙනුවෙන් ඉංගිරිසි නූගත් දෙමළ තරුණ තරුණියෝ එසේ ලැබුණු අවි සිංහලයන්ට හා ආණ්ඩුවට විරුද්ධව යොදාගත්හ. මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ වැඩි කාලයක් තිස්සේ ඉන්දියාව ද ත්‍රස්තවාදීන්ට ආධාර කෙළේ ය. එහෙත් දැන් අවුරුද්දක පමණ කාලයක සිට ඉන්දියාව වෙනත් ගමන් මගක යන බව පැහැදිලි ය. එහෙත් බටහිරයෝ අවුරුදු තුන්සිය පනහකට පමණ පසුව ද සිංහලයන්ට එරෙහිව දෙමළ ජාතිවාදයට ආයුධ සැපයූහ. අද ඔවුන් සිටින්නේ ආයුධ ලබාදීමට දෙවැනි ත්‍රස්තවාදී ප්‍රභාකරන් කෙනකු සොයමිනි. නන්දිකඩාල් කලපුවේ දී මියගියේ ප්‍රභාකරන් හා දෙමළ ත්‍රස්තවාදය පමණක් නො වේ. බටහිරයෝ ද එහි දී පැරදුණහ. න්‍යායික ව පරාජය වී සිටි ඔවුන්ගේ සංකල්ප එහි දී දේශපාලනික ව පරාජය විණි. මෙරට බටහිර හමුදා නොතිබිණි ද බටහිර ආයුධ විය. ත්‍රස්තවාදීහු බටහිරින් ලැබුණු ආයුධ යොදාගත්හ. ඒ නයින් බැලූ කල කස්ත්‍රෝට හා හෝ චි මිංට පසුව බටහිරයන් තීරණාත්මක ව පරාජය කරනු ලැබුයේ මහින්ද රාජපක්ෂ මහතා විසින් ය. බටහිරයන් මහින්ද රාජපක්ෂ මහතාගේ ලේ ඉල්ලන්නේ එබැවිනි.

බටහිරයන්ගේ මේ කොන්ත්‍රත්තු දෙක ඉටුකිරීමට සරත් ෆොන්සේකා ඉදිරිපත් වී සිටින්නේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් අවශ්‍ය ය. නන්දිකඩාල් සිද්ධියට ද පෙර ඇමරිකාවේ කැලිෆෝනියාවේ උසාවියක ඊනියා මානව අයිතිවාසිකම් කඩකිරීම පිළිබඳ පිටු පන්සිය ගණනක් ඉක්මවා යන චෝදනා පත්‍රයක් ගෝඨාභය රාජපක්ෂ මහතාට හා සරත් ෆොන්සේකාට එරෙහිව ඉදිරිපත් කෙරිණි. ඒ චෝදනාවලින් සරත් ෆොන්සේකා මුදාහැර ඔහු ඇමරිකාවේ රජයේ සාක්ෂිකරුවකු කර ගෝඨාභය රාජපක්ෂ මහින්ද රාජපක්ෂ මහතා ආදී පිරිසකට පමණක් චෝදනා ඉදිරිපත් කිරීමට කැලිෆෝනියන් බලධාරීන් ක්‍රියා කරනු ඇත. සරත් ෆොන්සේකාට දී ඇති කොන්ත්‍රාත්තු දෙක ම මූලික වශයෙන් මහින්ද රාජපක්ෂ මහතාගේ ලේ ඉල්ලීම සඳහා ය. සුදු කොඩි ඔස්සේ සෘජුවම යටත්විජිතවාදීන්ගේ දංගෙඩියට දැක්කීමට සරත් ෆොන්සේකා ඊනියා  තොරතුරු එකතු කරයි. අනෙක් අතින් දෙවැනි ප්‍රභාකරන්

© Prof. Nalin De Silva

කෙනකු බිහිකර මෙරට ලේ විලක් කර මහින්ද රාජපක්‍ෂ මහතාගේ ද ලේ ලබාගැනීමට බටහිරයෝ ක්‍රියා කරති. මෙරට ජනතාව ඒ සඳහා බටහිර යටත්විජිතවාදීන්ට කිසි දා ඉඩ නොදෙන බවට කිසිදු සැකයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva